134

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: ~~305~~

මගේ අංකය: කේ/ඒ/11/1
ආයතන අංශය,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ
අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7 - 1979 පෙබරවාරි 27

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් වෙත.

**රජයේ දෙපාර්තමේන්තු ව්‍යවස්ථාපිත මණ්ඩල සංස්ථා හා පළාත්පාලන ආයතනයන්හි, සමාජ සංගම්, විනෝද සහ ක්‍රීඩා සමාජවල මත්පැන් විකිණීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම**

අමාත්‍ය මණ්ඩලය විසින් 1979 පෙබරවාරි මස 07 වැනි දින පවත්වන්නට යෙදුණු සිය රැස්වීමේදී පහත සඳහන් තීරණයන් ගෙන ඇත.

1. රජයේ දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ පළාත් පාලන ආයතනයන්හි සමාජ සංගම්, විනෝද සහ ක්‍රීඩා සමාජ, යථෝක්ත ආයතනවල කාර්යාල පිහිටි ගොඩනැගිල්ලේම හෝ එම ආයතනවල කාර්යාල ගොඩනැගිල්ල පිහිටි භූමියේම හෝ පිහිටා ඇති අවස්ථාවල, එම සමාජයන්හි මත්පැන් විකිණීම හෝ එම ස්ථානවල තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් කළ යුතුය.

11. ඉහත (1) හි දක්වා ඇති පරිදි පිහිටා නොමැති සමාජයන්හි මත්පැන් විකිණීම සම්බන්ධයෙන් බාධාවක් නොවිය යුතුය.

2. එහෙයින් ඉහත (1) වන ඡේදයේ තීරණය ක්‍රියාත්මක කිරීම පිළිබඳව කරුණාකර වග බලා ගන්නා අතර, දැනටමත් නිකුත් කර ඇති අදාල මත්පැන් විකිණීමේ බලපත්‍ර අවලංගු කිරීමට බලපත්‍ර නිකුත් කිරීමේ බලධාරියා සමග කටයුතු කරනු මැනවි.

අ.ක/ඩී.බී.අයි.පී.එස්.සිරිවර්ධන
ලේකම්
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශය

ආයතන අධ්‍යක්ෂ.

-/සු.26